**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදීඋපාධි (බාහිර - නව නිර්දේශය)පරීක්ෂණය100 මට්ටම- 2020**

**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதியபாடத்திட்டம்) 100 வதுதேர்ச்சிமட்டம் 2020**

**Bachelor of Arts (External - New Syllabus) 100 Level - 2020**

**Take-Home Open Book Examination**

## ECNE 101: ආර්ථික විද්‍යාව හැඳින්වීම

**උපදෙස්:**

සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න

මුළු ලකුණු =100

---

1.

i නිශ්චිත හා ආවස්ථික පිරිවැය අතර වෙනස දක්වන්න. සුදුසු උදාහරණයක් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිළි කරන්න.

ii ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම රේඛීය ස්වරූපයක් ගන්නා බව සිතන්න. ආවස්ථික පිරිවැයෙහි ස්වභාවය ගැන මෙයින් කියවෙන්නේ කුමක්ද?

iii ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිමට ඇතුළතින් ක්‍රියාත්මක වන්නේ නම් ඊට හේතු මොනවාද?

iv ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම පිටතට විතැන්වීමට බලපාන සාධක මොනවාද?

v පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් මුහුණදෙන ගැටලුවලට හිඟකම, තේරීම, හා පිරිවැය සම්බන්ධවන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

(එක් කොටසකට ලකුණු 3යි)

2. a.

i. ඉල්ලුම් න්‍යාය දක්වන්න (ලකුණු 1 යි)

ii. භාණ්ඩයක ඉල්ලුම ඉහළ යාමට බලපාන සාධක මොනවාද? (ලකුණු 2 යි)

iii. සාමාන්‍ය භාණ්ඩයක මිළ පහළ යාමක් නිසා භාණ්ඩයක ඉල්ලුම ඉහළ නොයන්නේ මන්ද? (ලකුණු 2 යි)

iv. පසුගිය දශක දෙකක කාලය තුළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බාහිර උපාධි සඳහා අධ්‍යන ගාස්තු 10% කින් ඉහළ ගොස් තිබේ. ඒ සමගම, ඇතුළත් කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 1000 සිට 2000 දක්වා ඉහළ ගොස් තිබේ. මෙම උදාහරණය මගින් ඉල්ලුම් නීතිය වැරදි බවට ඇඟවෙන්නේද? එසේ වන්නේ ඇයි? හෝ එසේ නොවන්නේ ඇයි?

(ලකුණු 3 යි)

b. සංඛ්‍යාන විද්‍යාඥයන් සඳහා ඉල්ලුම හා සැපයුම පහත දී ඇත. Qs=4P-80, Qd= 100-2P
මෙහි P මගින් පැයක් සඳහා වැටුප, Qs= සැපයුම් ප්‍රමාණය , Qd= ඉල්ලුම් ප්‍රමාණය දී ඇත.

i. ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 1 යි)
ii. සමතුලිත මිළ හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 2 යි)
iii. සමතුලිතයේදී පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තතය ගනනය කරන්න. (ලකුණු 4 යි)

3. a.
i නිෂ්පාදන ශ්‍රිතය විස්තර කරන්න. (ලකුණු 3 යි)
ii ශ්‍රමයේ ආන්තික නිමවුම හා සාමාන්‍ය නිමවුම නිර්වචනය කරන්න. ශ්‍රමයේ ආන්තික නිමවුම හා සාමාන්‍ය නිමවුම අතර සම්බන්ධතාව ප්‍රස්තාරයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 4 යි)

b.
i විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය වෙන් කොට දක්වන්න. (ලකුණු 2 යි)
ii මුලු පිරිවැය, ස්ථාවර පිරිවැය, හා ආන්තික පිරිවැය වක්‍රවල හැඩය විස්තර කරන්න. (ලකුණු 3 යි)
iii ආන්තික පිරිවැය නිර්වචනය කොට ආන්තික හා සාමාන්‍ය පිරිවැය අතර සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 3 යි)

4. පහත සඳහන් දෑ කෙටියෙන් විස්තර කරන්න.

i. මුදල්වල කාර්යභාරයන්
ii. අධි බලැති මුදල් (මුදල් පදනම)
iii. මුදලේ සංසරණ ප්‍රවේගය
iv. පිස්කල් (අයවැය) හිගය හා එහි ගම්‍යවීම්
v. රජයේ අයවැය හිගය මූල්‍යනය කිරීම. (එක් කොටසකට ලකුණු 3යි)

5. a. i. සමාහාර වියදම්වල අඩංගු දෑ මොනවාද? (ලකුණු 3 යි)
ii. මූර්ත ජාතික ආදායම මට්ටම හා වෙනස් වන අංගයන් මොනවාද? (ලකුණු 3 යි)

b. ආර්තිකයක පරිභෝජන ශ්‍රිතය $C = 0.7 + 0.8Y_d$ වේ.
Yd= වැය කල හැකි ආදායම (Yd=Y-T)
I= ආයෝජන = 400
රජයේ වියදම් = 800
අපනයන ආදායම් = 600
ආනයන ශ්‍රිතය = 0.15Y
බදු ආදායම් ශ්‍රිතය = 0.3Y ,

i. සමතුලිත ජාතික ආදායම සොයන්න. එය ප්‍රස්තාරයක පෙන්වන්න. (ලකුණු 3 යි)
ii. MPC හා MPS ගනනය කොට අර්ථය පහැදිළි කරන්න. (ලකුණු 2 යි)
iii. ශුද්ධ අපනයන ශ්‍රිතය සොයන්න. (ලකුණු 2 යි)
iv. ඉතිරි කිරීම් ශ්‍රිතය සොයන්න. (ලකුණු 2 යි)

6. පහත සඳහන් ඒවාට කෙටි සටහන් ලියන්න.

i. ආවස්ථික පිරිවැය හා PPC
ii. මිළ අවම සීමාව හා මිළ උපරිම සීමාව
iii. නාමික පොලී අනුපාතය හා මූර්ත පොලී අනුපාතය
iv. මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති
v. GDP අවධමනකය හා උද්ධමනය (එක් කොටසකට ලකුණු 5යි)